පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව - සති පාසල
සැප්. 3 සතිය
විෂය - විද්‍යාව
9 ශ්‍රේණිය
කාලය - පැය 3
සැකසුම - එම්.ජී.ඒ.වී.කේ. ධර්මරත්න.
කලාප අධ්‍යාපන කාර්යාලය - නිවිතිගල.

**මාතෘකාව - තරංග පරාවර්තනය හා වර්තනය**

පාඩම - ආලෝක වර්තනය

* මෙම අධ්‍යයනය අවසානයේදී ඔබ,

- ආලෝක වර්තනය ආදර්ශණය කිරීමට ක්‍රියාකාරකම් සිදු කරයි.
- ආලෝකය එක් පාරදෘශ්‍ය මාධ්‍යක සිට වෙනත් පාරදෘශ්‍ය මාධ්‍යකට ඇතුල්වීමේදී ගමන්මග වෙනස් වීම(නැවී ගමන් කිරීම) වර්තනය ලෙස ප්‍රකාශ කරයි.
- ආලෝක වර්තනය නිසා සිදුවන ආවරණ සඳහා නිදසුන් සපයයි.
- ප්‍රිස්මය තුලින් ආලෝකය ගමන් කිරීමේදී වර්ණාවලියක් හට ගන්නා අයුරු ආදර්ශණය කරයි.
- සූර්යාලෝකය වර්ණ හතක මිශ්‍රණයක් බව ප්‍රකාශ කරයි.
- දේදුන්න ඇති වන්නේ සූර්යාලෝකයේ වර්ණ විභේදනයෙන් බව ප්‍රකාශ කරයි.

පළමුව, 9 ශ්‍රේණියේ පෙළ පොත ii කොටසෙහි පිටු අංක 75හි 14.10 ක්‍රියාකාරකම සිදු කර ඒ ආශ්‍රිත පිටු අංක 76හි 1,2,3,4 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (ලේසර් පන්දම භාවිතා කරන්නේ නම් වැඩිහිටියෙකුගෙන් උපදෙස් ලබාගන්න)

ඉන්පසු පිටු අංක 76 හොඳින් කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. සෑම විටම ආලෝක කිරණයන්හි දිශාව වෙනස් වන්නේ කොහෙදීද ?
2. අතුරු මුහුණතට ලම්භකව පතනය වන ආලෝක කිරණයන්හි දිශාව වෙනස්වේද ? නොවේද ?
3. “ආලෝක වර්තනය” යන්න අර්ථකථනයක් සපයන්න.

දැන්, 76 පිටුවේ 14.31 රූපය අධ්‍යයනය කර එය පිටපත් කරන්න.එහි පතන කිරණය, පතන ලක්ෂ්‍ය, අතුරු මුහුණත, වර්තන කිරණය හා වර්තන කෝණය නම් කරන්න.

පසුව 77 පිටුවෙහි 14.11 ක්‍රියාකාරකම සිදු කරන්න.

1. එහි 14.33 රූපය ඇඳ අදාල තොරතුරු ලකුණු කරන්න.

දැන් පිටු අංක 78 හා 79 හොඳින් කිපවරක් කියවන්න.

1. පළමුව 14.12 ක්‍රියාකාරකම සිදුකරන්න.
2. 14.34 රූපය පිටපත් කර සත්‍ය ගැඹුර හා දෘශ්‍ය ගැඹුර සටහන් කර ඒ ගැන සිතා බලන්න.
3. ජලාශයකට හෝ ළිදකට බැසීමට පෙර සත්‍ය ගැඹුර හා දෘශ්‍ය ගැඹුර පිලිබඳ සොයා බැලිය යුතු බව වටහාගන්න.
4. 14.35 රූපය අනුව ජල බඳුනකට පැන්සලක් දමා පැන්සල පෙනෙන අයුරු පිළිබඳ අත්දැකීම ලබාගන්න.

ඉන්පසුව 14.13 ක්‍රියාකාරකම සිදු කරන්න.ඒ අනුව, පහත ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.

1. ඔබ පළමුව යැවූ ආලෝකයේ පැහැය ලියන්න.
2. ප්‍රිස්මයේ වර්තනයෙන් පසු තිරයමත වර්ණ කීයකට එය බෙදී ඇත්ද ? එම වර්ණ ලියා දක්වන්න.
3. අපකිරණය යන්න අර්ථ දක්වන්න.

80 පිටුව කියවා,

1. දේදුන්න ඇතිවීම සිදුවන අයුරු ප්‍රකාශ කරන්න.
2. නිව්ටන් තැටිය තැනීමට උත්සහා කරන්න.

** අමතර දැනුම සඳහා, හැකිනම්,

- 11 ශ්‍රේණියේ පෙළ පොත 1 කොටසෙහි පිටු අංක 116,117 හා 118 කියවන්න.
- ඔබ ගුරුතුමා සතුව ඇති 11ශ්‍රේණිය විද්‍යාව SMART TEXTBOOK හි වර්තනයට අදාල කොටස ගැන විමසන්න.